# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 ජනවාරි

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2018 ජනවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 5.4%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 7.3%ක් ලෙස වාර්තා විය. තවද පසුගිය 2017 ජනවාරි මාසයෙන් පසුව වාර්තාවූ අවම උද්ධමනය වාර්තා වූයේ 2018 ජනවාරි මාසයේදීය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.0%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 ජනවාරි මාසයේ ආහාර කාණ්ඩයේ දායකත්වය 2.9%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.6%ක් විය.

කෙසේ නමුත් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2017 දෙසැම්බර් මාසයේ 126.6ක් වූ දර්ශක අගය 2018 ජනවාරි මාසයේ 125.8ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 ජනවාරි මාසයේ දර්ශකාංක 0.8ක අඩුවීමක් හෝ 0.6ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.78%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.11%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, අමු මිරිස්, පොල්, රතුළූණු, සහල්, දෙහි, ලොකුළූණු, මයිසූර් පරිප්පු, අර්තාපල්, සුදුළූණු සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් අළුත් මාළු, කෙසෙල්, අඹ, පැපොල්, කුකුල් මස්, මිරිස් කුඩු සහ කරවල යන ආහාර ද්‍රව්‍යවල වියදම්වල වටිනාකම වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ආපනශාලා හා හෝටල්', 'ප්‍රවාහන', 'විවිධ භාණ්ඩ හා සේවා', 'අධ්‍යාපන', 'සෞඛ්‍ය' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' යන කාණ්ඩවල වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසය තුළ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සන්නිවේදන' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව